**විසර්ජන ශීර්ෂය - 130 - පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය**

**විගණකාධිපති වාර්තාව - 2011 වර්ෂය**

1.1 විගණන විෂය පථය

පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 ජූනි දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැළසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

## 2. ගිණුම්

### 2.1 විසර්ජන ගිණුම

#### මුළු ප්‍රතිපාදනය හා වියදම

අමාත්‍යාංශය සදහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.6,561,223,456 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.6,221,104,407 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ඉතිරිවීම් රු.340,119,049 ක් වී තිබුණු අතර එය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට5 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම් විස්තරය | ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය | ඇස්තමේන්තු ගත ප්‍රතපාදනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| පුනරාවර්තන | 172,610,000 | 172,064,000 | 9,283,424 | 5.39 |
| මූලධන | 4,360,250,000 | 6,389,159,456 | 330,835,625 | 5.17 |
| එකතුව | 4,532,860,000 | 6,561,223,456 | 340,119,049 | |

### 2.2 අත්තිකාරම් ගිණුම්

#### රජයේ නිලධාරීන්ටඅත්තිකාරම් ගිණුම්

##### පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සිමාවන්

විෂය අංක 13001 දරන රජයේ නිලධාර්න්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂ | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. | රු. | රු. | රු. | රු. | රු. |

| | | | | | |
|---|---|---|---|---|---|
| 7,850,000 | 5,660,412 | 3,900,000 | 4,764,514 | 35,000,000 | 24,841,655 |

2.3 පොදු තැන්පත් ගිණුම

2011 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ පොදු තැන්පත් ගිණුමේ ශේෂ එකතුව රු. 20,708,204 ක් විය.

2.4 ගිණුම් හා සැසදුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණය

2011 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසදුම් ප්‍රකාශනවල තත්ත්වය ප්‍රකාශ වන, මෙහි (අ) සිට (උ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 2.5 සිට 2.10 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන නිරීක්ෂණ හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණය |
|---|---|---|
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 842 | 2009 වර්ෂයට පෙර සටහන් නොතිබීම. |
| වාහන ලේඛනය | මුදල් රෙගුලාසි 1647 | ලැබුණු සහ ඉවත් කළ වාහන පිළිබඳ සටහන් ඇතුලත් කර නොතිබීම. |

(ආ) අයවැය විචලනය

(i) වැය විෂයයන් 04 ක් සඳහා සළසා තිබුණු රු.47,250,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ii) වැය විෂයයන් 06 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු රු.198,952,963 ක ඉතිරිය එම වැය විෂයයන්ට අදාල

ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 72 ත් සියයට 96 ත් අතර පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබුණි.

| වැය විෂයය | වැය විෂයය විස්තරය | ශුද්ධ ප්‍රතිපාදනය | ඉතිරිය | ඉතිරියේ ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | | රු. | රු. | % |
| 130-1-1-1303 | නඩත්තු වියදම් - ගොඩනැගිලි හා ඉදිකිරීම් | 100,000 | 93,978 | 94 |
| 130-1-1-2002 | මූලධන වත්කම් පුනරුත්ථාපනය - යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 400,000 | 383,500 | 96 |
| 130-2-3-16-2502(14) | මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය | 185,000,000 | 175,045,317 | 95 |
| 130-2-3-20-2504(14) | උතුරු මැද පළාත් මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය | 11,000,000 | 8,256,187 | 75 |
| 130-2-3-20-2504(17) | උතුරු මැද පළාත් මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය | 750,000 | 709,094 | 95 |
| 130-2-4-10-2502(11) | පඩුවස්නුවර සංවර්ධන වැඩසටහන | 20,000,000 | 14,464,887 | 72 |
| | | 217,250,000 | 198,952,963 | |

(iii) අමාත්‍යාංශය වැය විෂයන් කිහිපයක් වෙනුවෙන් පරිපූරක ඇස්තමේන්තු මගින් ප්‍රතිපාදන සළසාගෙන තිබුණු අතර, වැය විෂයයන් 05 ක එම පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන සියයට 30 සිට සියයට 100 දක්වා පරාසයක ඌන උපයෝජිතව පැවති බව නිරීක්ෂණය විය.

| වැය විෂයය | පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන මුදල | උපයෝජිත මුදල | ඉතිරිය | ඉතිරියේ ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| 130-1-1-1001 | 2,500,000 | 1,753,773 | 746,227 | 30 |
| 130-1-1-1401 | 1,000,000 | 395,747 | 604,253 | 60 |
| 130-2-3-3-2504(17) | 250,000,000 | 212,407,501 | 137,407,501 | 75 |
| 130-2-3-21-2504(14) | 10,000,000 | - | 10,000,000 | 100 |
| 130-2-3-21-2504(17) | 2,000,000 | - | 2,000,000 | 100 |

(ඇ) සංයුක්ත සැළැස්ම

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානින් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැළැස්මක් අමාතාංශය විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කළයුතු වුවත්, එම සැළැස්ම 2011 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

(ඈ) වාර්ෂික ක්‍රියාකාර සැළැස්ම

2011 වර්ෂයේ ක්‍රියාකාර සැළැස්ම සකස් කර ඉදිරිපත් කර තිබුණද, අමාත්‍යාංශයේ සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධ දත්තවල මූල්‍යමය ඉලක්කයන් පමණක් සඳහන් කර තිබුණු අතර, භෞතික ඉලක්කයන් දක්වා නොතිබුණි.

(ඉ) වාර්ෂික කාර්ය සාධන වාර්තාව

ඉහත (ඇ) සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12 හා 2004 පෙබරවාරි 20 දින දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ 402 හා 402(1) ප්‍රකාර මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත අමාත්‍යාංශය විසින් පිළියෙල කළයුතු වාර්ෂික කාර්ය සාධන වාර්තාව විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළයුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල කාර්ය සාධන වාර්තාව 2013 මැයි 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

(ඊ) වාර්ෂික ප්‍රසම්පාදන සැළැස්ම

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැළැස්ම 2011 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

(උ) අග්‍රිම ගිණුම

මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව කාර්ය නිමකළ වහාම තත්කාර්ය අතුරු අග්‍රිමය නිරවුල් කළයුතු වුවත්, කාර්ය නිමවී මාස 05 ක් දක්වා ප්‍රමාදයකින් පසුව රු.850,242 ක අතුරු අග්‍රිම නිරවුල් කර තිබුණි.

2.5 වත්කම් කළමනාකරණය

වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

මුදල් රෙගුලාසි 756 හා 757 අනුව අමාත්‍යාංශය විසින් වාර්ෂිකව භාණ්ඩ සමීක්ෂණ පවත්වා ඇතත් අමාත්‍යාංශය සතු වාහන සම්බන්ධයෙන් 2011 වර්ෂය වෙනුවෙන් සමීක්ෂණ පවත්වා නොතිබුණි.

2.6 අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| නීති රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) ආයතන සංග්‍රහය | | |
| (i) viii වැනි පරිච්ඡේදයේ 3 වන වගන්තිය | 2,773,426 | අතිකාල ගෙවිය හැකි අවස්ථා තහවුරු කර ගැනීම සඳහා කළ වැඩ පිළිබඳ විස්තර සඳහන් කර නොතිබුණි. |
| (ii) xxiv වැනි පරිච්ඡේදයේ 4.2.3 වගන්තිය | 446,571 | **" අවලංග කළ නොහැකි පොරොන්දුව "** ණයකරු විසින් ඉදිරිපත් නොකළ ලිපිගොනු 07 ක් නියැදි පරීක්ෂාවේ දී අනාවරණය විය. |
| (ආ) ජනාධිපති ලේකම් කාර්යාලයේ චක්‍රලේඛ | | |
| (i) 2010 මැයි 14 දිනැති අංක CA/1/17/1 දරන චක්‍රලේඛයේ 3.1 ඡේදය | - | ඡේදයට පටහැනිව අමාත්‍යවරයා වෙත වැඩිපුර වාහන 03 ක් වෙන් කර තිබීම. |
| (ii) 2.1 ඡේදය | 1,603,072 | ඡේදයට පටහැනිව රියදුරන් දෙදෙනෙකු, කාර්යාල කාර්ය සහායක දෙදෙනෙකු වැඩිපුර සේවයේ යොදවා ගෙන තිබුණි. පළාත් පාලන හා පළාත් |

සහා අමාත්‍යාංශ ලේකම්වරයාට අනුව **" ගරු අමාත්‍යතුමා විසින් තම අවශ්‍යතාවය අනුව රියදුරන් දෙදෙනෙකු වෙන්කර ගත්තද අමාත්‍යාංශය සඳහා වූ අනුමත කාර්ය මණ්ඩලය නොඉක්මවන පරිදි රියදුරන් කළමනාකරණය කරගෙන ඇති බව කාරුණිකව දන්වමි "** යනුවෙන් සඳහන් විය.

2.7 කාර්ය සාධනය
----------------

අමාත්‍යාංශයේ 2011 වර්ෂයේ ක්‍රියාකාරී සැළැස්ම හා කාර්ය සාධනය පිළිබඳ පරීක්ෂාවේ දී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) දෙහිඕවිට බහුකාර්ය සංකීරණය ඉදිකිරීම
---------------------------------------------

මෙම ඉදිකිරීමට 2011 වර්ෂය සඳහා රු. මිලියන 48 ක් වෙන් කර තිබුණු අතර, වර්ෂය තුල රු.මිලියන 40 ක් පමණක් වැයකර තිබුණි. 2010 වර්ෂයේ දෙසැම්බර් මස ආරම්භ කළ ව්‍යාපෘතිය 2012 වර්ෂයේ අවසන් කිරීමට නියමිතව තිබුණි. 2011 දෙසැම්බර් 22 වන විටත් සියයට 40 ක භෞතික ප්‍රගතියක් පමණක් ලබා ඇති බව ලිපිගොනු තොරතුරු අනුව නිරීක්ෂණය වුවත්, 2012 මාර්තු මස වන විට කරන ලද වැඩවල වටිනාකම රු.87,565,066 ක් බව ඉංජිනේරු කාර්ය පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යංශය (CECB) දක්වා තිබූ අතර, එය කොන්ත්‍රාත් මුදල වන රු.254,160,231 න් සියයට 34 ක ප්‍රමාණයකි. මෙම ව්‍යාපෘතිය සඳහා කරන ලද වැඩ සඳහා ගෙවීම් කිරීමට ප්‍රමාද කිරීමක් සිදුවී තිබුණු අතර, සැළසුම් කරන ලද ආකාරයට ප්‍රගතියක් ලබා නොතිබුණි. 2012 වර්ෂය අවසාන වන විට ද සැළසුම් කළ පරිදි වැඩ අවසන් කිරීමට නොහැකි වී තිබුණි.

(ii) පසුගාමී පළාත් පාලන ආයතන නගා සිටුවීම
------------------------------------------------

අමාත්‍යාංශයේ පළාත් පාලන අංශය මගින් පසුගාමී පළාත් පාලන ආයතනවලට ආධාර උපකාර කිරීම අරමුණ වී තිබුණු අතර, 2011 වර්ෂය වන විට පසුගාමී පළාත් පාලන ආයතන 103 ක් හඳුනාගෙන තිබුණි. මෙම ආයතනවලින් ආයතන 15 ක් සඳහා පමණක් අබලන් වාහන අළුත්වැඩියා කිරීම සඳහා 2011 වර්ෂය තුල රු.13,791,802 ක මුදලක් ලබා දී තිබුණි.

වාහන අළුත්වැඩියා වියදම් පරීක්ෂාවේ දී සමහර වාහන ඉතා පැරණි වුවත් ඒවායේ වටිනා-කම ඉක්මවන මුදලක් අළුත්වැඩියා සඳහා වැයකර තිබෙන අතර, දේශීය නියෝජිත ආයතනවලින් අළුත්වැඩියා කිරීම් සිදුකර තිබුණි.

ක්‍රියාකාර් සැළැස්ම අනුව පළාත් පාලන ආයතනයක් වෙනුවෙන් වාහන අළුත්වැඩියා සඳහා රු.මිලියන 1 ක උපරිම ඇස්තමේන්තු ප්‍රතිපාදන වෙන් කරන බව සඳහන් වුවද රු. මිලියන 1 ට වැඩි අළුත්වැඩියා වියදම් 6 ක් දරා තිබුණි.

අඩු ආදායම්ලාභී පළාත් පාලන ආයතන නගා සිටුවීමට ආධාර සැපයීම යටතේ හඳුනා ගන්නා ලද ආයතන 103 න් ආයතන 14ක් සඳහා 2011 වර්ෂයේ රු.32,193,055 ක් වූ ආධාර ඒ ඒ ආයතනවල ගොඩනැගිලි ඉදිකිරීමත්, උපකරණ මිලදී ගැනීමත් සඳහා ලබා දී තිබූ නමුත් ක්‍රියාකාර් සැළැස්මේ සඳහන් පරිදි ආදායම් උත්පාදන මාර්ග වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ආධාර කිසිවක් ලබා දී නොතිබුණි.

2.8 මතභේදයට තුඩුදෙන ගනුදෙනු
---------------------------------

අමාත්‍යාංශය විසින් කර ඇති සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි පරීක්ෂණවලදී එසේ අනාවරණය වූ ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) අමාත්‍ය කාර්ය මණ්ඩලය සඳහා රාජ්‍ය සේවයෙන් හෝ තාවකාලිකව බඳවා නොගෙන සංසථා, මණ්ඩලවලින් බඳවා ගැනීම නිසා සමාලෝචිත වර්ෂය තුල රු.1,336,143 ක් වැටුප් වශයෙන් වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ සේවකයන් සඳහා ගෙවනු ලබන ප්‍රසාද දීමනා හා නිවාඩු දින දීමනා වශයෙන් රු.255,470 ක් අමාත්‍යාංශයෙන් ප්‍රතිපූර්ණය කර තිබුණි.

2.9 අනාර්ථික ගණුදෙනු
---------------------

නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අරපිරිමැස්මෙන් තොරව එළඹ තිබුණු ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) අමාත්‍යවරයාගේ නිල නිවසේ ජලය, විදුලිය සඳහා සමාලෝචිත වර්ෂය තුලදී පිළිවෙලින් රු.192,207 ක් හා රු.916,695 ක් ගෙවීමට සිදුව තිබුණි.

(ආ) බිල්පත් නිසි පරිදි නොගෙවීම නිසා ජල බිල්පත් සඳහා රු.17,584 ක ප්‍රමාද ගාස්තු ද විදුලි බිල්පත් සඳහා රු.2,939 ක පොලියක්ද ගෙවීමට සිදුවී තිබුණි.

2.10 මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යා

------------------------------------------------------

2011 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 27 | 19 | 08 |
| (ii) | තෘතීයික මට්ටම | 04 | 02 | 02 |
| (iii) | ද්විතීයික මට්ටම | 130 | 82 | 48 |
| (iv ) | ප්‍රාථමික මට්ටම | 54 | 39 | 15 |
| (v) | වෙනත් (අනියම්/තාවකාලික/කොන්ත්‍රාත් පදනම) | - | 11 | - |
| | එකතුව | 215 | 153 | 73 |